තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## ඩී.එම්.ඒ.රන්ජිත් දිසානායක එ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1459/2019 (2019.11.25) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.
.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ:ජනරාල්-** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** - ඩී.එම්.ඒ.රන්ජිත් දිසානායක
**නොතිසි ලත් පාර්ශවය**- නම් කළ නිලධාරී, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**පෙනීසිටීම**

අභියාචක - ඩී.එම්.ඒ.රන්ජිත් දිසානායක
පොදු අධිකාරිය- එච්.ජේ.එම්.සී.ඒ. ජයසුන්දර- විභාග කොමසාරිස් (පාලන හා විමර්ශන)
පී.එම්. හීනටිගල - එම්.එස්.ඕ. .

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.03.19 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | 2019.04.12 |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.04.04 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | 2019.05.15 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු | 2019.04.25 |

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

| | |
|---|---|
| කළ දිනය | |

## **අභියාචනයට පසුබිම් වූ කරුණු**:

අභියාචක විසින් 2019.03.19 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.

2007.03.10 පැවති ග්‍රාම නිලධාරී විභාගයේ අභියාචක යොමු කළ මුළු අයදුම්පත ළඟ සිට බැලීමට

තොරතුරු නිලධාරියා 2019.04.12 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ 2007 වර්ෂය අදාළ අයදුම්පත් මේ වන විට අපහරණය කර ඇති බැවින් අභියාචකගේ ඉල්ලීම ඉටු කළ නොහැකි බවයි. අභියාචක විසින් 2019.04.04 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා 2019.05.15 දිනැතිව ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ තොරතුරු නිලධාරී විසින් දැනුවත් කර ඇති ආකාරයට අයදුම්පත් මේ වන විට අපහරණය කර ඇති බැවින් අභියාචකගේ ඉල්ලීම ඉටු කළ නොහැකි බවයි. මෙම තීරණයෙන් ද අභියාචක සෑහීමකට පත් නොවූ හෙයින් 2019.04.25 දිනැතිව අභියාචක විසින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

## **අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

2019.11.25 පාර්ශව දෙකම පැමිණ සිටිති. අභියාචක විභාගයකට පෙනී සිට ඇත. එහෙත් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමක් නොලැබුණු බව පවසයි. අයදුම්පත්‍ර අපහරණය කර ඇති නිසා මෙම ඉල්ලීම ඉටු කළ නොහැකි බව පොදු අධිකාරිය දැනුම් දී ඇත.

## **නියෝගය:**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු පොදු අධිකාරිය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නැති බව පිළිගැනේ. ඒ අනුව ගොනුවේ කටයුතු අවසන් වේ.

කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.